# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
# 21.06.2018 දින පැවැත්වූ දේශනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සර්වඥ සම්මාසම්බුදු පියාණන් වහන්සේට සියළුම ධර්මයන් පරෝපදේශ රහිතව ස්වයංභූ ඥානයෙන් සර්වඥතාඥානයෙන් අවබෝධකොට ගත්තා වූ කිසිම කෙනෙකුගේ උදව්වක් උපකාරයක් නැතිව සන්තානගත සියලුම ක්ලේශ ධර්මයන් විනාසකොට පිරිසිඳුකොට ගත්තාවූ නිර්වාණ ධාතුව අවබෝධකොට ගත්තාවූ මාර්ගය සර්වාකාරයෙන්ම වැඩුවාවූ ඒ ධර්මයන් ලෝකයාට මහත් කරුණාවෙන් දේශනාකොට වදාළා වූ අනන්ත ධර්මයන්ගෙන් පිරුණා වූ සන්තානයක් ඇති සර්වඥ සම්මාසම්බුදු පියාණන්වහන්සේට, ධර්ම රාජයාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන්වහන්සේගේ සර්වඥතාඥානයෙන්, උතුම් නුවණින් දැන වදාළා වූ දැක වදාළා වූ සියලුම සත්වයන්ට නිර්වාණ ධාතුව හෙළිකරන්නා වූ පෙන්වා දෙන්නා වූ නවලොව්තුරා ශ්‍රී සත්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුවෙන් සැනසී වදාළා වූ සුපටිපන්න ආදී ගුණයන්ගෙන් සමලංකෘත වූ ආහුණෙය්‍යා ආදී ගුණයන්ගෙන් පිරුණා වූ ජීවිත ඇති මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් වූ බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් තුනුරුවන් වන්දනා කිරීමේ මෙනෙහි කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අසාගෙන සිටින්නාවූ මේ පින්වත් සියලු දෙනාම මේ මොහොත දක්වාම වඩාගත්තාවූ රැස් කරගත්තා වූ සීල සමාධි ප්‍රඥා ගුණයන්ගේ ආනුභාවයෙන්, බලයෙන් අදත් මේ කියලා දෙන්නාවූ ධර්ම කාරණා ටික සැම දෙනාටම හොඳින් වටහා ගන්න තේරුම් ගන්න අවබෝධ කරගන්න ලැබේවා! සැම දෙනාටම ඒ සඳහා නික්ලේශී චිත්ත පරිසරයක් ගොඩ නැගේවා! නීවරණ ධර්මයන්ගෙන් පීඩාවක් නොවිඳීවා. සමාධි ගතවූ සිතෙන්, සිහියෙන් නුවණින් ක්‍රියාත්මක උනා වූ සිතින් සැම ධර්ම කාරණයක්ම හොඳින් වටහාගෙන හොඳින් තේරුම් අරගෙන

එය මාර්ගයක් හැටියට වැඩි දියුණුකරගෙන උතුම් නිර්වාණ ධාතුව අවබෝධකරගන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශිර්වාද කරනවා.

අද අපි මේ ධර්ම සාකච්ඡාව තුලින් කථාකරන්නේ විශේෂ ධර්ම කාරණයක්. ඒ තමයි **අනන්තර පච්චයට** අනුකූලව විසර්ජනා වාරය කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා. අපි මීට කලියෙන් විසර්ජනා වාර හෙවත් වීථිවාර තුනක් කියවලා තිබෙනවා. **හේතු ප්‍රත්‍යය** යටතේ විථිවාර 7 කථා කළා. ඊළඟට **ආරම්මණ ප්‍රත්‍යය** යටතේ විසර්ජනා වාර 9 කථා කළා. පසුගිය දිනයේ **අධිපති ප්‍රත්‍යය** යටතේ අපි විසර්ජනා වාර 10 කථා කළා. දැන් අපි **අනන්තර ප්‍රත්‍යයට** ඇවිල්ලා තිබෙනවා. අනන්තර ප්‍රත්‍යය යටතේ **අනන්තර ප්‍රත්‍යය** ක්‍රියාත්මක වෙන විසර්ජනා වාර 7 ක් තිබෙනවා. ඒ ධර්ම කරුණු ටික තමයි අපි අද මේ පින්වතුන් එක්ක කථා කරන්නේ, ධර්ම මනසිකාරය පවත්වන්නේ.

මිට පෙර **අනන්තර ප්‍රත්‍යය** පිළිබඳව කියලා තිබෙනවා, කථා කරලා තිබෙනවා, සාකච්ඡා කරලා තිබෙනවා. ඒ උනත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ පහළ වෙලා අවුරුදු 2500 කට පමණ පසුව ඉන්නා වූ අපිට යම් යම් ආකාරයෙන් ඒවා මතක නැති වෙන ස්වභාවයක් තියෙනවා නම් ඒක නැවත අපි ක්‍රියාත්මක කරවා ගන්න මේ විදියට හිතමු. **අනන්තර ප්‍රත්‍යය** කියන එක වටහාගන්නේ නැතුව, ඒකට අදාළ ධර්ම පරිසරය නැවත හිතට මතුකරගන්නේ නැතුව මේ කාරණය තේරුම් ගන්න අමාරු වේවි. ඒක නිසා අපි තේරුම් ගනිමු ඒ කාරණය.

**අන්නතර ප්‍රත්‍යය -** යම්කිසි වෙලාවක වර්තමානයේ පහළ වෙන සිත ඇතිවෙන්නේ සදාකාලිකව ඉන්න හයියක් ගැම්මක් ඇතිව නොවෙයි. ඒක ධර්ම ස්වභායක්. හිතක් ඇතිවෙනවා, යම් කිසි චිත්ත බලවේගයක්, චිත්ත ධර්ම ස්වාභාවයක්, චිත්ත ගුණ විශේෂයක් මතුවෙනවා. ඒ චිත්ත ස්වභාවය ක්ෂණයකින් නැතිවී යනවා. එයින් අනතුරුව තව හිතක් පහළ වෙනවා. ඒකත් පෙර පරිද්දෙන්ම නැතිවෙලා යනවා. ඔය හටගැනීමේ ගතිය නැති වී යාමේ ගතිය ඒකට අදාළ ලක්ෂණ දෙකක්. මේ චිත්ත ධර්ම, චිත්ත ගුණ පහළ වෙන්නේ ඇතිවීම නැතිවීම යන ධර්ම දෙකට යටත්වයි. චිත්තය කියලා නම් කරගෙන

යමක් පහළ වෙනවා. හිතක් පහළ උනහම ඒ චිත්තය කියන ධර්ම විශේෂය, බල විශේෂය, ගුණ විශේෂය නැති වී යන්නේ, කැඩිලා යන්නේ එයට ගැලපෙන විදියේ තවත් හිතකට නෑ කමක් හදා දීගෙනමයි. තමන්ගෙන් පස්සේ අඩුවක් නොවේවා, තමන්ගෙන් පස්සේ එතැන හිස් තැනක් නොවේවා කියන්න වගේ හරියටම ඒ නැතිවී යන්නා වූ හිතට ගැව්ගෙන සමාන ගුණ ඇති යම්කිසි ධර්ම ස්වභාවයකට යටත්ව හිතක් පහළ කරන, නැතිනම් පළවෙනි සිතෙන් දෙවෙනි සිතට නැගිටින්න කූද්දවාගෙන යනවා වගේ ගතියක් තිබෙනවා ඔය හිත්වල. තමන් නැතිවෙලා යනවා නමුත් ඊළඟ එකට යම් කිසි බලයක් විසික්කරනවාක් මෙන් අනිත් එක්කෙනාව ඇහැරවාගෙන යන්නාක් මෙන් ගතියක් තිබෙනවා මේ හිත්වල. ඒකයි, කොච්චර හිතුවත් අපිට සසර යන්න වෙලා තිබෙන්නෙ, දිගට දිගට, දිගට දිගට හිත් පහළ වෙන මේ වැඩේ හින්දයි. මේක නවතින්නේ නෑ. ඒක නිසා මේ හිත්වල තිබෙනවා පරමපරා අනුයාතව ඉස්සරහට එකක් හැදේවා කියලා ඒ සිත හැදෙන්න පරිසරයක් හදාගෙන ගැම්මක් හදාගෙන ඒ වගේ ශක්තියක් විසිකරගෙන නැතිවී යන ගතියක්. ඒක තිබෙන්නේ නැති වී යන හිතේ. ඊළඟ හිතට ගුණය විසිකරන, ශක්තිය දෙන ගතියට කියනවා **'අනන්තර ප්‍රත්‍යය'** ගුණය කියලා. **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය කියලා. ඒක නිසා තමයි හිතක් කැඩෙනකොට ඒකට සමාන හිතක් පහළ වෙන්නේ. ඒ සිත් පහළ වීම තමාගේ වගේම වෙන්න ඕනවෙන්නේ නෑ. තමාම වගේ සිතුත් තිබෙනවා. තමා වගේ නොවන සිතුත් තිබෙනවා. හබැයි ඊළඟ සිත හරියට ගැලපිලා වැටෙන්න තමයි හදන්නේ. ඔන්න ඔය ගතියට, ඔය ශක්තියට කියනවා **අනන්තර ප්‍රත්‍යය** කියලා.

එතකොට තව එකක් අපි දැන ගන්න ඕන. හිත් පහළ වීම උඩින් පල්ලෙන් එහෙන් මෙහෙන් සිද්ධ වෙන්නේ නෑ. එකේ තිබෙනවා චිත්ත නියාමයක්. එක්තරා චිත්ත ක්‍රම වේදයක්. සිත් පහළ වෙන පිළිවෙලක්. ඒක ධර්මස්වභාවයක්. කවුරුවත් පාලනය කරන පාලකයෙක් යටතේ තිබෙන එකක් නොවෙයි ඒක. ඒක ධර්ම ගුණ විශේෂයක්. චිත්ත නියාමයකට, චිත්ත රැල්ලකට, චිත්ත ධර්ම ස්වභාවයකට යටත්ව ඒකට අනුකූලව සිත් පහළ වෙනවා. එතකොට දිගටම සිත් පහළ වෙනවා. අපි ඒ සිත් පහළ වෙන විදිය ගැන කථා කළා මීට ඉස්සර වෙලා. ඒ තමයි චිත්ත වීථියක සිත් කොහොමද ඇතිවෙන්නේ කියලා. ඒ චිත්ත වීථිය ගැනත් අපි දැනුවත් වෙලා ඉන්න ඕන. මම හිතන්නේ අපේ පින්වතුන් දේශනා කරපු දෙශ්නාවල් වරින් වර අහනවා බලනවා ඇති. නමුත් මෙතෙන්ටත් අපි ඒක නැවත අලුත් කරගමු.

චිත්ත වීථි තිබෙනවා පංචද්වාරාවජ්ජන චිත්ත වීථි සහ මනෝද්වාරාවජ්ජන චිත්ත වීථි යනුවෙන්. මේ ද්වාරික වශයෙන් සංග්‍රහ කරන විදිය. නමුත් මේ අද කථා කරන්නෙත් චිත්ත වීථි කථාවක් තමයි. මේකට කියන්නේ **විසර්ජනා වාර චිත්ත වීථි** කියලා. දැන් මම මේ මොහොතේ කියන්නේ අපි ඉස්සරවෙලා කථා කරපු චිත්ත වීථි. ඒක මෙහෙමයි එන්නේ.

**භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංච ද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්තපන - ජවන්- ජවන්- ජවන් - ජවන් - ජවන් -ජවන් -ජවන් - තදාරම්මණ - තදාරම්මණ** - දැන් බලන්න මෙතැන චිතක්ෂණ 17 කට ගොනු උනා වූ චිත්තක්ෂණ 17 කින් තිබෙන්නා වූ සිත් පෙළක්, සිත් වැලක්, සිත් පරම්පරාවක් යනවා පේළියට. මේක නිර්මාපකයෙක් නැතුව, දේව අධිකාරිත්වයක්, බ්‍රහ්ම අධිකාරිත්වයක්, පුද්ගල අධිකාරිතාවයක් නැතිව ඊශ්වර අධිකාරිත්වයක් නැතුව ක්‍රමානුකූලව දිගට යනවා. හැම සිතකම මේක තිබෙනවා. පළමුවෙන් පහළ වෙන්නා වූ සිතෙන් දෙවෙනි සිතට අමුතු ගැම්මක් දීගෙන තල්ලු වීගෙන ඇතිල්ලීගෙන ඊළඟ එක්කෙනා කූද්දාගෙන ඇහැරවාගෙන නැගිට්ටවාගෙන යන ගතියක් ඔය සිත් පෙළේ තිබෙනවා. ඒක නිසා තමයි පළවෙනි එක්කෙනා නැතිවෙන කොට දෙවෙනි එක්කෙනා, දෙවෙනි එක්කෙනා නැතිවෙන කොට තුන්වෙනි එක්කෙනා, තුන්වෙනි එක්කෙනා නැතිවෙනකොට හතරවෙනි එක්කෙනා. ඔය විදියට තමයි යන්නේ. එතකොට ඒ පේළිවල, කූද්දන ගතිය දෙවෙනි එක්කෙනාට උපදින්න ශක්තියක් හලාගෙන, විසිකරගෙන, තට්ටු කරගෙන වගේ යන ගතියට කියනවා **අනන්තර ප්‍රත්‍යය** කියලා.

මෙතැන පරෙස්සම් විය යුතු තැනක්. මම පාවිච්චි කළා මෙහෙම වචනයක් "දෙවෙනි එක්කෙනාව කූද්දවාගෙන ඇහරවාගෙන යන්න වගේ" කියලා. කෙනෙකුට හිතෙන්න පුළුවන් 'දෙවෙනි එක්කෙනා ඇහැරවන්න නම් පළවෙනි එක්කෙනා යනකොට දෙවෙනි එක්කෙනා ඇවිල්ල ඉන්න ඕන' කියලා. ඒක නිසා පළවෙනි එක්කෙනා නැති වෙන්නේ දෙවෙනි එකෙනා ආවට පස්සේ කියලා. එහෙම වෙන්නේ නෑ. ඒක නොවෙයි මම අදහස් කළේ. මෙයා

නැතිවෙන කොටම අනිත් එක්කෙනා මෙයාගේ ඥාතිත්වය, මෙයාගේ පිළිවෙල, ශක්තිය, ආනුභාවය ටිකක් අරගෙන මතුවෙන එකයි මේ කිව්වේ. ඔය විදියේ වැඩක් තිබෙනවා. පළවෙනි හිත ඊළඟ එක්කෙනාට ශක්තියක් වේගෙන යන ගතියට ප්‍රත්‍යයක් වේගෙන යන ගතියට කියනවා **අනන්තර ප්‍රත්‍යය** ස්වභාවය කියලා. මේක දිගටම සිද්ධ වෙනවා. විශේෂිත ස්ථාන කීපයකුත් ගැන කථා කළා. ඒක පස්සට තියා ගමු. නැත්නම් track එකෙන් එළියට යනවා. දැන් මේ **අනන්තර ප්‍රත්‍යය** ගැනයි කිව්වේ.

එකම එක තැනක් අපි හිතා ගන්න ඕන. ඒක විශේෂයි තේරුම් ගන්න. ඒ තමයි, අපි කථා කරනවා අභිධර්ම විස්තරය යටතේ ධර්මතා 4 ක් ගැන. ඒ තමයි චිත්ත ධර්ම, චෛතසික ධර්ම, රූප ධර්ම, නිර්වාණ ධර්ම. මේ ධර්ම ස්වභාව 4 තමයි මූලික පරමාර්ථ ධර්ම හැටියට මේ අභිධර්මය කියන ධර්ම විග්‍රය යටතේ අපි කථා කරන්නේ. සමහර අවස්ථාවලදී එනම් ආරම්මණ ප්‍රත්‍යය යටතේ කථා කරනකොට මේ හතරම එක්කාසු වෙනවා, නියෝජනය වෙනවා, චිත්ත චෛතසික රූප නිර්වාණ අරමුණු වීම් වශයෙන්. සමහර වෙලාවට නිර්වාණය අයින් වෙලා චිත්ත චෛතසික රූප විතරක් වැටෙනවා. මේ **අනන්තර ප්‍රත්‍යය** ගැන කතාකරන කොට අපි තේරුම් ගතයුතුයි, මතක තබා ගත යුතුයි **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය ක්‍රියාත්මක වෙන්නේ **නාම ධර්ම** වල පමණයි කියලා. ඒ කියන්නේ **චිත්ත චෛතසික** වල පමණයි. රූප සහ නිර්වාණ ධාතුව මේකට අහුවෙන්නේ නෑ. ඒක එක විශේෂත්වයක්.

ඊළඟට අපි දැනගන්න ඕන කෙනෙකුගේ චිත්ත පරම්පරාවේ අවසාන හිත ගැන. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ චිත්ත පරම්පරාවේ අවසාන චිත්තය, රහතන්වහන්සේගේ නමකගේ චිත්ත පරම්පරාවේ අවසාන චිත්තය, ඒක මනුස්ස ලෝකයේ වෙන්න පුළුවන් බ්‍රහ්මලෝකයේ වෙන්න පුළුවන්. කොහේ හරි රහතන්වහන්සේගේ අවසාන චිත්තයට කියනවා චුති චිත්තය කියලා. හැබැයි ඒ චුති චිත්තය අපේ සාමාන්‍යකෙනෙකුගේ චුති චිත්තයක් වගේ නොවෙයි. ඒක අමුතුම අමුතු චුති චිත්තයක්. පුදුම ගතියක් තිබෙන ශක්තියක් තිබෙන පුදුම ගුණ විශේෂයක් තිබෙන චුති චිත්තයක්, රහතන්වහන්සේගේ චුති චිත්තය.

ඒ තමයි රහතන්වහන්සේ නමකගේ චුති චිත්තයට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ගුණය නෑ. අන්න ඒක තේරුම් ගන්න විශේෂයි. අපේ මේ වැඩ සටහන කරගෙන ආපු පින්වතුනුත් අලුතෙන් සම්බන්ධ වෙච්ච අයත් ඒවාගේම ඊළඟට මේක ගුවන්විදුලිය හරහා අහන පින්වතුනුත් සියලුදෙනාම මතක තබාගත යුතුයි රහතන්වහන්සේගේ චුති චිත්තයට **අනන්තර ප්‍රත්‍යය ශක්තිය නෑ.** රහතන්වහන්සේගේ ඔක්කොම සිත් වලට නොවෙයි. රහතන්වහන්සේගේ ක්‍රියාසිත් වල තිබෙනවා **අනන්තර ප්‍රත්‍යය** ගතිය. මේ කියන්නේ රහතන්වහන්සේගේ චුති චිත්ත ගැන. එතැන **අනන්තර ප්‍රත්‍යය ගුණය නෑ.** හේතුව, රහතන්වහන්සේගේ චුති චිත්තයෙන් පස්සේ තව හිතක් පහළ වෙන්නේ නෑ. ඒක නිසා ඒ චුති චිත්තය නැති වෙනකොට තවත් හිතකට පහළ වෙන්න ගුණයක් විසිකරගෙන යන්න දෙයක් නෑ. හේතුව ඒකෙ **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය නැති හින්ද. අනිත් හැම එකේම තිබෙනවා. මේක මතක තබාගන්න. සිත 89 ක් තිබෙනවා. ඒ හැම එකේම **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය තිබෙනවා. රූප වලට මේ ප්‍රත්‍යය සම්බන්ධ වෙන්නේ නෑ. මේ ටික හිතේ තියා ගන්න.

**අනන්තර ප්‍රත්‍යය කියලා කිව්වේ කලින් පහළ උනාවූ සිත ඊළඟට පහළ වෙන්නා වූ සිතට හරි ගානට යම්කිසි ගුණ විශේෂයක් තල්ලු කරගෙන වීසි කරගෙන යන්නා වගේ ගතියක් කියන එක. නාම ධර්ම වලට විතරයි මේ ප්‍රත්‍යය අදාළ වෙන්නේ. රහතන්වහන්සේගේ චුති චිත්තයේ මේ ප්‍රත්‍යය ගුණය නෑ කියලා කිව්වා.**

දැන් අපි අද අපිට අදාළ වැඩේට යන්න ඕනෑ. ඒ තමයි මේ අනන්තර ප්‍රත්‍යයයේ තිබෙනවා විසර්ජන වාරය හෙවත් ඒක සිද්ධ වෙන ක්‍රම විදි විසඳලා දෙන්නා වූ වීථි 7 ක්.

1) **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො =** කුසල ධර්මයක් තවත් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

සිත් තිබෙනවා 89 ක්. ඒකෙන් අපි කොටස් කරගත්තා කුසල සිත් කියලා ජාතියක්. ඊළඟට අකුසල සිත් කියලා ජාතියක්. ඊළඟට අහේතුක සිත් කියලා ජාතියක් සහ ක්‍රියා සිත් කියලා ජාතියක්. ඒකෙන් අපි සරලව ගත්තොත් තික මතිකාවේ පළවෙනි තුනට ගිහිල්ලා කුසල ධර්ම හැටියට කුසල සිත්, අකුසල ධර්ම හැටියට අකුසල සිත්, ඒවාගේම අව්‍යාකෘත ධර්ම හැටියට තව ගොඩක් තෝරා ගත්තා. මේ කුසල සිත් කියන ඒවා ඔක්කොම වැඩ කරන්නේ ජවන් සිත්වල. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස** = කුසල ධර්මයක් කුසල ධර්මයකට, **අනන්තරපච්චයෙන පච්චයො** = අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන කථාව වීථියක දාල විසර්ජනා වාරයකට දාල අපිට කියලා දෙනවා.

මම මතක් කළා මේ පින්වතුන්ට අපි කියපු චිත්ත වීථියක්. ඒ චිත්ත වීථියක තියෙනවා ජවන් 7 ක්. ඒ කියන්නේ මහන්තාරම්මණ, අති මහන්තාරම්මණ චිත්ත වීථියක් ගත්තහම ජවන් 7 ක් තිබෙනවා. ඇහෙන් රූපයක් දැක්කහම කනෙන් සද්දයක් ඇහෙනකොට නාසයෙන් ගඳ සුවඳක් ස්පර්ශ වෙන කොට දිවෙන් රසක් දැනෙන කොට කයෙන් ස්පර්ශයක් හැදෙන කොට ඒකට සම්බන්ධව යනවා සිතුවිලි පෙළක්. ඒකට කියනවා චිත්ත වීථියක් කියලා. මේ වීථියේ තිබෙනවා අහේතුක සිත්. සහේතුක සිත් තිබෙනවා. ඔය මැද්දැවක තිබෙනවා ජවන් සිත් කියලා ජාතියක්. ඒ ජවන් සිතකට කිට්ටු කරලා ජවන් සිතකට සම්බන්ධ කරලා තමයි අපි මේ කාරණය පැහැදිලිව තේරුම් ගත යුතු වෙන්නේ.

භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ. මෙතන සිත් 5 තිබෙනවා. මේ සිත් පහම කුසල් නොවෙන අකුසල් නොවෙන අහේතුක කොටසට යන සිත්. ඒ ගැන නොවෙයි මේ කියන්නේ.

තවත් ඉස්සරහට යනකොට මෙහෙම තිබෙනවා. සම්පටිච්ඡන - සන්තීරණ - වොත්තපන යනුවෙන් තවත් සිත් තුනක් තිබෙනවා.

භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්තපන යන චිත්ත වීථියේ තිබෙන මේ සිත් 8 කුසල් ගණයට සඳහන් කරන්නේ නෑ. අකුසල් ගණයට සඳහන් කරන්නෙත් නෑ. එහෙම නම් මේ වාක්‍යයේ තිබෙනවා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. එතකොට මේ කුසල කථාව වැටෙන්නේ ජවනයක් හරියේ. ජවන් තිබෙනවා 7 ක්. එතකොට ඒ ජවන් හතේ අවසාන ජවනය කුසල ජවනයක්. 6 වෙනි ජවනයත් කුසල ජවනයක්. 5 වෙනි එකත් කුසල ජවනයක්. 4 වෙනි ජවනය 3 වෙනි ජවනය 2 වෙනි ජවනය සහ පළවෙනි ජවනය යන සියල්ල කුසල ජවන්.

මේ 7 වෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය කියන එක ලැබුණේ 6 වෙනි එකෙන්. 6 වෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබුවේ 5 වෙනි එකෙන්. 5 වෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබුණේ 4වෙනි එකෙන්. 4 වෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබුණේ 3වෙනි එකෙන්. 3 වෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබුණේ දෙවෙනි එකෙන්. දෙවෙනි කුසල ජවනයට පහළ වෙන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබුණේ පළවෙනි වෙනි එකෙන්.

එතකොට බලන්න පළවෙනි ජවන් සිතේ තිබෙන කුසල අනන්තර ප්‍රත්‍යය ශක්තිය දෙවෙනි එකට ගියා. දෙවෙනි එකෙන් තුවෙනි එකට දුන්නා. තුන් වෙනි එක හතර වෙනි එකට දුන්නා. හතරවෙනි එක පස්වෙනි එකට දුන්නා. පස් වෙන්කි එක හය වෙනි එකට දුන්නා. හය වෙනි එක හත්වෙනි එකට දුන්නා. දැන් මේ තමයි අනන්තර ප්‍රත්‍යය ශක්තිය ප්‍රදානය කරපු විදිය. මේ කථාවේදී හොඳට තේරුම් ගන්න අනන්තර ප්‍රත්‍යය ශක්තිය දෙන්නෙත් **කුසල සිතක්** අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබන්නෙත් **කුසල සිතක්.** ඒකයි කියන්නේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස** කියලා. **කුසල** සිතක්ම තමයි අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබා දෙන්නේ. අනන්තර ප්‍රත්‍යය ශක්තිය ගන්නෙත් **කුසල** සිතක්. ඔය හරියේදී තමයි ඕක සිද්ධ වෙන්නේ. අපි මේ විදියට මේ කාරණය තේරුම් ගනිමු.

මෙතන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. බැග් මලු හාරලා ගත්තහම තමයි ඕවා තේරෙන්නේ. මම කියාගෙන ගියා මුලින් කියන්නේ නැතුව අවසානයෙන්, විස්තර විග්‍රහ කිරීමට සහ වටහා ගැනීමට පහසු නිසා. හත්වෙනි එකට හයෙන්, හයවෙනි එකට පහෙන්, පස්වෙනි එකට හතරෙන්, හතරවෙනි එකට තුනෙන්, තුන් වෙනි එකට දෙකෙන්, දෙවෙනි එකට පළවෙනි එකෙන් කියලා. හැබැයි පළවෙනි එකට මුලින් ජවනයක් නෑ. ඒක නිසා කුසල ජවන් පටන්ගන්නේම පළවෙනි එකෙන්. පළවෙනි කුසල ජවනයට කලින් කුසල් ජවනයක් නෑ. **කුසල් සිද්ධවෙන්න මොකක්වත් නැති හින්ද පළවෙනි ජවනය කුසල අනන්තර ප්‍රත්‍යය ශක්තියක් ලබන්නේ නෑ. ඒ කියන්නේ පළවෙනි ජවන් සිත ප්‍රත්‍යය උප්පන්න භාවයට පත්වෙන්නේ නෑ** කියන එකයි. හත්වෙනි ජවනයේ ප්‍රශ්නයක් නෑ.

අපි මෙහෙම බලමු. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** යන මේ වීථිය හොඳට මතක තියාගන්න. කුසල් වර්ග කීපයක් තිබෙනවානේ. දැන් බලන්න කුසල ගණයට වැඩ කරන සිත් තිබෙනවා ඔක්කොම 21. ඒ තමයි කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර කුසල් සිත් 5 (අභිධර්ම විග්‍රහයේ හැටියට) + අරූපාවචර කුසල් සිත් 4 + ලෝකෝත්තර මාර්ග සිත් අපරියාපන්න වශයෙන් කුසල් සිත් 4 = 21. මේ සිත් 21 වැඩ කරන්නේ, කියාත්මක වෙන්නේ ඒවා පහළ වෙන්න හේතු භූත වෙන, ඒවා පහළ වෙන්න ක්‍රියාත්මක වෙන කාමාවචර චිත්ත වීථිවල හෝ අර්පණා ජවන් චිත්ත වීථිවල හෝ මහග්ගත චිත්ත වීථිවල හෝ ලෝකෝත්තර මාර්ග චිත්ත වීථිවල.

අපි හිතමු අපි දානයක් දෙනවා කියලා. දානමය පින්කමක් කරනකොට ඒ දානය සම්බන්ධයෙන් කුසල චිත්ත වීථි මහාගොඩක් පහළ වෙනවා. දානය ගන්න කොට බෙදන කොට ඊළඟට හිතනකොට ඒ ගැන අහනකොට මේ දානයට සම්බන්ධ ඒ සැම ක්‍රියාවක් අනුවම කුසල චිත්ත වීථි ගොඩක් පහළ වෙනවා. කාමාවචර කුසල් චිත්ත වීථි ඇතුළු හැම කුසල චිත්ත වීථියකම පළවෙනි ජවනය දෙවෙනි එකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. දෙවෙනි එක තුන්වෙනි එකට, තුන්වෙනි එක හතරවෙනි එකට, හතරවෙනි එක පස්වෙනි එකට, පස්වෙනි එක හයවෙනි එකට, හයවෙනි එක හත්වෙනි එකට **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන විදියට ඔය අපි නොකියපු, නොකියන, කථා නොකරන ධර්ම ස්වභාවයක් ඔතන සිද්ධවෙනවා.

ඔය ධර්ම ස්වභාවය තථාගතයන් වහන්සේගේ නුවණට හසුවෙලා තිබෙනවා. මේක හරියට කියනවා නම් ලෝහයකින් හදපු යම් කිසි දිලිසෙන භාජන දෙකක් ළඟ තැබුවම ඒ භාජනයේ තිබෙන දිලිසෙන ගතිය අර ළඟින් තිබෙන එකට වදිනවා. ඒකට කාගෙවත් බලකිරීමක් මොකක්වත් ඕනේ නෑ. හිත් වලත් තිබෙනවා එකක් නැතිවෙනකොට අනිත් එකට බැබලීමක් ඡායාවක් ගහන ගතියක්. තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානයට මේ ධර්ම වල මෙහෙම දෙයක් සිද්ධවෙනවා කියන බව ඉතාමත්ව පැහැදිලිව ඉතාමත් ලස්සනට නිරවුල්ව දැක්ක.

ඊළඟට අපි හිතමු අපි සිහිය පිහිටුවාගෙන ඒ ධර්මය දැකපු තථාගතයන් වහන්සේට උතුම් හිතකින් ගාථා කිය කියා වදිනවා කියලා. චිත්ත වීථිවල කුසල් ජවන් පහළ වෙනවා කෝටිගණන්. ඒ හැම චිත්ත වීථියකම පහළ වෙන්නාවූ ජවන් වල පළවෙනි එකෙන් දෙවෙනි එකට දෙවෙනි එකෙන් තුන්වෙනි එකට තුන්වෙනි එකෙන් හතරවෙනි එකට හතරවෙනි එහෙන් පස්වෙනි එකට පස් වෙනි එකෙන් හයවෙනි එකට හයවෙනි එකෙන් හත්වෙනි එකට **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන හැටියට **අනන්තර ප්‍රත්‍යය** සිද්ධ වේගෙන යනවා. අපි දන්නේ නෑ. මෙනෙහි කලොත් විතරයි අපි දන්නේ සුතමය ඥානයෙන්. නැත්නම් මේක සිද්ධ වෙනවා.

තව එකක් අපි හිතමු මෙහෙම. අපි භාවනා කරනවා. අනාපානසතියනේ තථාගත සර්වඥතාඥාන උපකාරක උතුම් කර්මස්ථානය. ඒ කර්මස්ථානය වඩනවා. අනාපාන සතිය වඩනකොට දැන් හොඳට සිත සමාධිවෙලා. සිත කොහේවත් යන්නේ නෑ, දුවන්නේ නෑ, නිස්කලංකයි. කාම අරමුණු එන්නේ නෑ, රාග අරමුණු එන්නේ නෑ. ඇලෙන්නේ නෑ, ලෝභ කරන්නේ නෑ. ද්වේශය නෑ. ඊර්ෂ්‍යාව මාන මොකක්වත් නෑ. උද්දච්චයක් පහළ වෙන්නේ නෑ. නිදිමතකුත් නෑ, සිත ක්‍රියාත්මකයි. සැකයක් සංකාවක් නෑ. පංච නීවරණධර්මයන් යට ගැහිලා ගිහිල්ලා හිත හරි එකඟයි. හිත හරි ශාන්තයි. මේ ශාන්ත වූ සිත තවම ධ්‍යාන ලබලා නෑ. කාමාවචර සිත් වැඩ කරන්නාවූ පරිසරයක කාමාවචර සිත්ම තිබෙන්නා වූ තැනක පංච නීවරණ ධර්මයන් යටපත් උනොත් එතැන තිබෙනවා සමාධියක්. එතැන තිබෙනවා හරි ශාන්ත හරිම ලස්සන සමාධියක්. නමුත් එතැන තිබෙන ඒ සමාධියට වගකියන සිත් පහළ වෙන චිත්ත වීථි කාමාවචරයි.

කාමාවචර චිත්ත වීථි හරි bright. ඒ පහළ වෙන්නේ සෝමනස්ස සහගත ඤානසම්ප්‍රයුක්ත කුසල් සිත්. මේකට කියනවා ලස්සන නමක්. ධ්‍යානයකට, ධ්‍යාන සමාධියකට, අර්පණාභාවයකට ළඟම තිබෙන ළඟම ඥාතිත්වය දරන්නා වූ සමාධියට **උපචාර සමාධිය** කියලා කියනවා. මේ **උපචාර සමාධිය** තමයි නීවරණ ධර්ම යටපත් වෙච්ච තැන. කාමාවචර චිත්ත වීථි ගිහිල්ලා ඊට පස්සේ රූපාවචරයට නැමෙන්නාවූ තැනක තිබෙන චිත්ත වීථිවලට කියනවා අර්පණා චිත්ත වීථි කියලා. අපි හිතමු පළවෙනි එක කියලා. දැන් ධ්‍යානයකට යනවා. ධ්‍යානයකට යනකොට කාමාවචර සිත් පේළියක් හරහා තමයි අර අර්පණා සමාධියට යන්නේ. ඒක bridge එකක් වගෙයි. කාමාවචර ස්වභාවයේ ඉඳලා රූපාවචර ධ්‍යාන සිතට යනවා. ඒක පාලමක් වගේ සිත් පෙළක්. ඒකට කියනවා පළවෙනි අර්පණා චිත්ත වීථිය කියලා. ඒ අර්පණා චිත්ත වීථියේ තිබෙනවා මෙහෙම ටිකක්. මේක දැනගෙන තේරුම් අරගෙන තිබෙන අයට නැවත මතුකරන ලස්සන ධර්මමය පින්තූරයක් මේක. මේ චිත්ත වීථියේ තිබෙනවා 'පරිකර්ම' 'උපචාර' 'අනුලෝම' 'ගෝත්‍රභූ' කියලා සිත් ටිකක්. ඊළඟට පහළ වෙනවා ධ්‍යාන සිත්. මේ ධ්‍යාන සිත් කුසල්. මෙතන තිබෙනවා වර්ග දෙකක්. ඒ තමයි කාමාවචර කුසල සිතුත් තිබෙනවා. ධ්‍යාන කුසල සිතුත් තිබෙනවා. ඉස්සෙල්ලාම ධ්‍යානයකට ගොඩ වෙනකොට ඒ ධ්‍යාන සිතට කලින් තිබෙන හිතට කියනවා 'ගෝත්‍රභූ' හිත කියලා. ගෝත්‍රභූ හිතට කලින් තිබෙන්නේ 'අනුලෝම' හිත. අනුලෝම හිතට කලින් තිබෙන්නේ 'උපචාර' හිත. උපචාර හිතට කලින් තිබෙන්නේ 'පරිකර්ම' සිත. (මෙය වෙනස් වෙන අවස්ථාද තිබෙනවා) ධ්‍යාන සිතට කලින් තිබෙන්නා වූ සිත 'ගෝත්‍රභූ' සිත. මේ 'ගෝත්‍රභූ' සිත දෙවෙනි ධ්‍යාන සිතට ඥාන සම්ප්‍රයුක්ත භාවයකින්, කුසල ධර්ම ස්වභාවයකින්, අනන්තර ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේ විදියටම සිද්ධ වෙනවා නිවන් දකින අවස්ථාවේදීත්. දෙවෙනි එකට යනකොටත් එහෙමයි. මේ කථා කරන්නේ **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත** කියන කුසල් සිත ගැනයි. කාමාවචර කුසල් සිත් අටක් තිබෙනවා. ඔය අටෙන් පළවෙනි සිත **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහ කුසල් සිත.** ඒ කුසල් 'සිත' අපි ඊට ඉහළ තිබෙන්නා වූ අර්පණා සිතකට යනකොට 'වෙන නමකින්' එතෙන්ට ඇවිල්ලා ඉන්නවා. දැන් බලන්න මෙහෙම

**පරිකර්ම සිත** = සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත
**උපචාර සිත** = සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත
**අනුලෝම සිත** = සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත
**ගෝත්‍රභූ සිත** = සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත

මේ සිත් හතරම ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් හතරක්. ඒ උනාට එතැන මේ කුසල් සිත මේ නමින් නොවෙයි වැඩ කරන්නේ. එතැනට අදාළ වැඩේ අනුව තමයි නම වැටෙන්නේ. ළමයින්ගේ තාත්තා ගෙදර ඉන්නකොටයි තාත්තා වෙන්නේ. වැඩ කරන තැනට ගියහම එයා තත්තා නොවෙයි. එයා office එහෙක වැඩ කරනවානම් එතැන officer. බස් එහෙක වැඩ කරනවා නම් ඒකෙ රියදුරා. ඉස්පිරිතාලයක වැඩ කරනවානම් එක්කෝ nurse එහෙම නැත්නම් දොස්තර මහත්තයා. ක්‍රියාවේ හැටියට තමයි එයාට නම වැටෙන්නේ. නමුත් ගෙදර එයා තාත්තා.

සෝමනස්ස සහගත මහා කුසල් සිත චිත්ත කාණ්ඩ වශයෙන් ගත්කල ඒකෙ තිබෙන ගුණාංග හැටියට එයාගේ නම මේක. නමුත් මේ සිත අර්පණා චිත්ත වීථියක වැඩ කරනකොට එතනට අනුව තමයි එයාට නම ලැබෙන්නේ එනම් ‘පරිකර්ම’ ‘උපචාර’ ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ වශයෙන්. මේ ‘ගෝත්‍රභූ’ සිතෙන් පස්සේ පහළ වෙන්නේ කාමාවචර භූමියෙන් ඉහළට ගියා වූ, කාමාවචර භූමියෙන් ඔසවා තැබුවා වූ සිත් වන ධ්‍යාන සිත්. එතනදී මේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන ධර්ම ස්වභාවය ක්‍රියාත්මක වෙලා එතැනත් මේ කාමාවචර සිත අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබා දෙනවා. මේ ක්‍රමයම තමයි මාර්ග සිතට ගියහමත්. සෝවාන් මාර්ග අවස්ථාවේදී ‘ගෝත්‍රභූ’ සිත ශක්තියක් වෙනවා නිවන් දකින මාර්ග සිතට. ඒවගේම ධ්‍යානයේදී මේ සිත ‘ගෝත්‍රභූ’ නම් වෙනවා. පළවෙනි සෝවාන් මාර්ග සිතේදී ‘ගෝත්‍රභූ’ ගුණය ඉදිරිපත් වෙනවා. ‘වෝදානය’ සිද්ධ කරනවා. මෙන්න මේ විදියට ප්‍රත්‍යය ශක්තිය ඇති කරනවා. මේ එක හිතක්.

තව තිබෙනවා උපේක්ඛා සහගත කුසල සිත්. ඒ උපේක්ඛා සහගත සිත් **අනන්තර ප්‍රත්‍යය** ශක්තිය ලබා දෙනවා උපේක්ෂා සහගත 4 වෙනි ධ්‍යාන අවස්ථාවේදී. තවත් තිබෙනවා සමාපත්ති සිත්වල, නිරෝධ සමාපත්තියට යනකොට සිද්ධ වෙන විදිය. අපි තේරුම් ගන්න ඕන මේ කියන්නා වූ චිත්ත වීථිවලට අනුකූලව මේ විසර්ජනයට අනුකූලව **‘කුසල ධර්මයක් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා’** කියන එක විග්‍රහ වෙන්නේ, අපිට කියලා දෙන්නේ

ඔන්න ඔය ස්වභාවයටයි. නමුත් අමතක නොකළ යුතුයි මේකේ විසර්ජනා වාර 7 ක් තිබෙනවා. දැන් මේ අපි කිව්වේ කුසල ධර්මයක් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබා දෙන හැටි.

ඊළඟට අපි තේරුම් ගනිමු මෙන්න මේ කාරණය. පට්ඨානය ගැන අහන්න හරි ඕනෑකමක් තිබුණා අපේ පිරිසට දැන් අවුරුදු කීපයකට කලින්. කොහොම කොහොම හරි අපි ඒක පටන් ගත්තා. දැන් ඇත්ත වශයෙන්ම අහන්නත් සන්තෝසයි ගොඩක් අය පට්ඨානය ගැන සකච්ඡා කරනවා අපිට අහන්න ලැබෙනවා, ස්වාමීන්වහන්සේලා සහ ගිහි පින්වතුන්. ඒ ගැන හරි සන්තෝසයි. පට්ඨානය ගැන කථා කරනකොට මුලින්ම කියනකොට කිව්වා මෙහෙම ධර්මතා තුනක්. **ප්‍රත්‍යය,** ප්‍රත්‍යයෙන් උපන්දේ එනම් **පච්චුපන්නය** ඊළඟට **ප්‍රත්‍යනීකය**. අපි මෙතැනදී ප්‍රත්‍යනීකය පිළිබඳව පොඩ්ඩක් එහෙට මෙහෙට කරලා ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්නය ගැන බලමු. ප්‍රත්‍යය කියන්නේ යම්කිසි දෙයක් ප්‍රත්‍යය ලබාදෙනවා. ප්‍රත්‍යය උප්පන්නය කියන්නේ ලබා දෙන දේ ගන්න එක්කෙනා හෙවත් ලබා දුන්න දෙයින් හටගන්න ධර්මය.

පළවෙනි ජවන් සිත අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා දෙවෙනි ජවනයට. දෙවෙනි ජවනය ප්‍රත්‍යය උප්පන්නයක්. පළවෙනි එක ප්‍රත්‍යයක්. අනන්තර ප්‍රත්‍යය තිබෙනවා පළවෙනි එකේ. ඒ වේලාවේදී පළවෙනි එකට සාපේක්ෂව දෙවෙනි එක ප්‍රත්‍යය උප්පනයක්. හැබැයි දෙවෙනි එක පළවෙනි එකට සාපේක්ෂව ප්‍රත්‍යය උප්පන්නය උනාට, පළවෙනි එකේ ප්‍රත්‍යය ලබාපු එක්කෙනා උනාට දෙවෙනි ජවනය නැති වී යනකොට තුන්වෙනි ජවනයට එයා ප්‍රත්‍යය වෙනවා. තුන්වෙනි ජවනය ප්‍රත්‍යය උප්පන්න වෙනවා. තුන්වෙනි ජවනය ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ දෙවෙනි ජවනයට සාපේක්ෂවයි. ඊළඟට තුන්වෙනි එක හතරවෙනි එකට ප්‍රත්‍යය වෙනවා, හතරවෙනි එක ප්‍රත්‍යය උප්පන්න වෙනවා. හතරවෙනි එක පස්වෙනි එකට ප්‍රත්‍යය වෙනවා, පස්වෙනි එක ප්‍රත්‍යය උප්පන්න වෙනවා. ඒක නිසා එක ධර්මයක් එක තැනක ප්‍රත්‍යයත් වෙනවා ප්‍රත්‍යය උප්පන්නයත් වෙනවා. ප්‍රත්‍යය උප්පන්නය කියන එකේ ස්වභාවය තමයි ඉස්සෙල්ලා එකෙන් හරි යාබදව තිබෙන්නාවූ දෙයින් හරි ලබා දෙන ප්‍රත්‍යය ගුණය තමන් ලබාගෙන ඒකෙන් මතුවෙනවා, ඒකෙන් උපදිනවා කියන එකයි. ඒක නිසා ඔය හැම තැනකදීම ප්‍රත්‍යයක් තිබෙනවා කියලා තේරුම් ගන්න ඕන. ඒ වාගේම ප්‍රත්‍යය උප්පන්නයක් වෙනවා කියන එකත් තේරුම් ගන්න ඕන. මේ කිව්වේ කුසල ධර්මය සම්බන්ධයෙන්.

මේකේ මෙහෙම තව විග්‍රහයකුත් ලබා දෙනවා.

**පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො** = පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ කුසල ධර්මයෝ පස්සේ පස්සේ පහළ වෙන කුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

**අනුලොමං ගොත්‍රභුස්ස අනන්තරපච්චයෙන පච්චයො -** මේ කාරණය කියන්න තමයි මම අර චිත්ත වීථියක points තුනක හතරක නම් කිව්වේ. **'අනුලොමං'** කියලා කියන්නේ ධ්‍යාන චිත්ත වීථියක නම් 'ගෝත්‍රභූ' හිතට කලින් හිතට කියනවා 'අනුලෝම' සිත කියලා. ඒ අනුලෝම සිත ගෝත්‍රභූ හිතට ප්‍රත්‍යයක් ලබලා දෙනවා. ඒ තමයි අනන්තර ප්‍රත්‍යය. ඒක අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. අපි හිතමු ඒක සිද්ධ උනේ සෝවාන් වෙන වෙලාවේ හෝ ධ්‍යානයක් ලබන වෙලාවේ කියලා. පෘතක්ජන කෙනෙක් නම් ධ්‍යාන ලබන වෙලාවේ. හැබැයි කවදාකවත් සෝවාන් වෙච්ච කෙනෙක් සකෘදාගාමි වෙනකොට නැවත වතාවක් ගෝත්‍රභූ සිතක් පහළ වෙන්නේ නෑ. සකෘදාගාමී මාර්ග සිතට කලින් පහළ වෙනවා ගෝත්‍රභූ හිත වගේ හිතක් නමුත් ඒක ගෝත්‍රභූ කෘත්‍යය කරන්නේ නෑ. එතැනදී සිද්ධ කරන්නේ **'වෝදාන'** කෘත්‍යයක්. පිරිසිදු කිරීමේ කෘත්‍යයක් කරන්නේ. අපේ පින්වතුන් මේ වෝදාන සිතයි ගෝත්‍රභූ සිතයි මේ වෙලාවේ පොඩ්ඩක් දැන ගන්න. ඒක පිහිට වේවි.

පළමුවෙන්ම සෝවාන් වූ වෙලාවේදී නිර්වාණය පැත්තට හිත හරවලා දාන, නිවන සලකුණු කරන ගතිය තමයි ගෝත්‍රභූ සිතින් කරන්නේ. ඉස්සරවෙලාම මාර්ග සිතට නිවන මෙන්න මේකයි කියලා mark එකක් ගහලා දෙන එකක් වගේ තමයි ගෝත්‍රභූ හිතින් කරන්නේ. ඒ හිතින් හැරිච්ච එක තමයි මාර්ග සිතින් දකින්නේ. මේ වෙලාවේ ඉස්සරවෙලාම සෝවාන් මාර්ග සිතින් නිවන දැක්කා. ඕකට ගෝත්‍රභූ හිත පිහිට උනා. හැබැයි සකෘදගාමි වෙනකොට දැන් නිවන පැත්තට හරවන්න දෙයක් නෑ. ඉස්සෙල්ලා හැරිලා තිබෙන්නේ. එතැනදී කරන්නේ ඉස්සරවෙලා තිබිච්ච දේ තව පැහැදිලි කරලා දක්වනවා.

අපි ඉරක් ගැහුවොත් ඒ ඉර උඩින් තව ඉරක් ගැහුවොත් වෙන්නේ ඒ ඉර හොඳට highlight වෙලා පේනවා. අන්න ඒ වාගේ එකක් තමයි **'වෝදාන'** හිත. 'අනුලෝම' හිත 'වෝදාන' හිතට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා. අනාගාමී වෙන වෙලාවෙත් 'අනුලෝම' හිත 'වෝදාන' හිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඊළඟට රහත් වෙන වෙලාවෙත් 'අනුලෝම' සිත 'වෝදාන' හිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

'ගෝත්‍රභූ' සිත සෝවාන් වෙන වෙලාවේ 'මාර්ග' සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. සකෘදාගාමී අනාගාමී අරිහත් කියන තැන් වලදී 'වෝදාන' කෘත්‍යයක් සිද්ධ කරනවා. ඒ වොදාන කෘත්‍යය සිද්ධ කරන කොට 'අනුලෝම' සිත 'වෝදාන' සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන කාරණය අපි දැනගත යුතුයි.

දැන් මම මේ දක්වාම කිව්වේ කුසල හිතක් කුසල හිතකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන හැටි. මේ අනන්තර ප්‍රත්‍යය මෙහෙම මතක තබා ගන්න. මේක හිත්වල පමණයි ක්‍රියාත්මක වෙන්නේ. එතෙන්ට විතරයි අදාළ වෙන්නේ. හටගෙන නැති වී යන්නාවූ සිත නැතිවෙන කොටම ඊළඟට පහළ වෙන සිතට අතරක් නැතුව ගැලපෙන විදියට, තවත් සිතකට පහළ වෙන්න සෙවනැල්ලක් හදාගෙන, ඡායාවක් වට්ටවාගෙන, ශක්තියක් දීගෙන විසිකරගෙන යන ගතිය තමයි අනන්තර ප්‍රත්‍යය වෙනවා කියලා කියන්නේ. ආන්න ඒක කුසල ධර්මයක වෙනහැටි තමයි කිව්වේ.

ඊළඟට මෙහෙම තිබෙනවා.

2) **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො -** මේක වෙනස්. ඉස්සෙලා කිව්වේ කුසලය කුසලයට. මෙතන කියන්නේ වෙන කථාවක්. **කුසලො ධම්මො** = කුසල ධර්මයක්, **අබ්‍යාකතස්ස ධම්මස්ස** = අව්‍යාකෘත වූ ධර්මයකට හෙවත් කුසලත් නොවෙන අකුසලුත් නොවෙන ධර්ම වලට, **අනන්තරපච්චයෙන පච්චයො** = අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය

වෙනවා. දැන් මෙතැනදී කුසල ධර්මයක් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ ‘අව්‍යාකෘත’ ධර්මයකට. මේක සිද්ධ වෙන්නේ මෙහෙමයි.

කුසල හිතක තිබෙන්නාවූ අනන්තර ප්‍රත්‍යය ශක්තිය අව්‍යාකෘතයක් ලබා ගන්නවා. අව්‍යාකෘතය තමයි ප්‍රත්‍යය උප්පන්නය. චිත්ත වීථියක අවසාන ජවනය කුසල් සිතක් කියලා හිතමු. එතකොට ඒ කුසල් සිතට පස්සේ තවත් ජවනයක් තිබුනා නම් තමයි කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො කියලා කියන්න පුළුවන් කම තිබෙන්නේ. හැබැයි හත්වෙනි කුසල ජවනයෙන් පස්සේ තව ජවනයක් නෑ. ඊට පස්සේ වෙන වර්ගයක හිත් පහළ වෙන්නේ. එතකොට පහළ වෙන්නේ **තදාරම්මණ** කියලා සිත් ජාතියක්. ඒ **තදාරම්මණ** සිත කුසල සිතක් නොවෙයි. ඒක ජවනයක් නොවෙයි. ඒක අව්‍යාකෘත හිතක්. තදාරම්මණයත් අව්‍යාකෘතයි. ඊට පස්සේ ඊළඟ තදරම්මණයත් අව්‍යාකෘතයි. ඊට පස්සේ භාවංග සිත් පහළ වෙනවා. ඒ භවාංගත් අව්‍යාකෘතයි. දැන් බලන්න, හත්වෙනි ජවන් සිත නැතිවී යනකොට ඒ ජවන් සිතේ යම් කිසි ගතියක්, යම් කිසි ගුණයක්, යම්කිසි අනන්තර ප්‍රත්‍යය ශක්තියක් ඊළඟ එකට ලබාදෙනවා ‘මේ වෙලාවේ තවත් ජවන් නැත, ඒක හින්ද තදාරම්මණ හිත අව්‍යාකෘතයක් හැටියට ඇවිල්ලා වැඩ කරන්න’ කියලා කියන්න වගේ.

මේ වෙලාවේ මගේ හිතට මෙහෙම එකක් මතක් වෙනවා. අපි හිතමු රටක නායකයෙක් ජනාධිපතිවරයා හරි අගමැතිවරයා හරි රට යනවා. රට යන කොට එයා පතකරලා යන්නේ නෑ තවත් ජනාධිපති වරයෙක්. එයා රට යනකොට පත්කරලා යන්නේ වෙන එක්කෙනෙක්. කවුරුහරි ඇමති වරයෙක් හරි පත්කරලා යනවා එයා වෙනුවෙන් වැඩ කරන්න. හැබයි එයා ජනාධිපති නොවෙයි. ජනාධිපති යනවා රට. ඉස්කෝලෙක ඉන්නේ එක ප්‍රින්සිපල් කෙනයි. ඒ ප්‍රින්සිපල් යනවා නම් එයාට පස්සේ වෙනත් ගුරුවරයෙකුට පවරලා යනවා තමන් වෙනුවෙන් වැඩ බලාගන්න කියලා. ඒවගේ ජවන් සිත් නැතිවී යනකොට ඒකට ගැලපෙන විදියට ඒ චිත්ත පේළියේ එයා වෙනුවෙන් ගැලපෙන විදියට අතරක් නැරෙන්න තදරම්මණවලට, අව්‍යාකෘත ධර්මයන්ට මේක ප්‍රත්‍යය වෙනවා. ඒක නිසා තමයි කියන්නේ **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. එතකොට ප්‍රත්‍යය ලබා දෙන්නේ

කුමක්ද? කුසල ධර්මයක්. ප්‍රත්‍යය උප්පන්නය වෙන්නේ, ඒ ප්‍රත්‍යය ලබාගන්නේ අව්‍යාකෘත ධර්මයක්. මේ එකක්.

අනිත් එක මෙහෙම හිතමු. තදාරම්මණ නැතුව කෙලින්ම භවාංග ඇතිවෙනවා කියලා. සමහර චිත්ත වීථි තිබෙනවා ඒවා කෙලින්ම ජවන් වලින් පස්සේ භවාංග. ඇත්තටම භවාංග සිත් කියලා කියන්නෙත් **අව්‍යාකෘත ධර්ම**. මෙය හොඳට ගැලපෙනවා. මෙහිදී හොඳට කියලා දෙනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. මේක තිබෙනවා රූපාවචරයේත් අරූපාවචරයේත්, හැම තැනම වැඩ කරන අපි කථා කරපු ඒ සිත්වල ඒ චිත්ත වීථි වල මේක වැඩ කරනවා.

තවත් මේකේ තිබෙනවා, අපි දැනට කිව්වේ **'කුසල ධර්මයක් කුසල ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන විදිය'** සහ **'කුසල ධර්මයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වෙන හැටි'.** ඒක නිසා අපි මේක මේ විදියට තේරුම් ගනිමු. මේ පින්වත් සැම දෙනාටම මේ කරුණුටික තේරුම් ගැනීමෙන් සිතීමෙන් මෙනෙහි කිරීමෙන් ඒවාගේම අනන්තර ප්‍රත්‍යය පිළිබඳව කථා කරන්න හිත යෙදීමෙන් පහළ කරගත්තාවූ කුසල ධර්ම සමුදායෙන් සැම දෙනාටම චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ වේවා! නිර්වාණ ධාතුව ස්පර්ශ කරන්න ලැබේවා! සසර දුකෙන් මිදිලා හේතු ඵල ධර්මයන්ගෙන් විනිර්මුක්ත වෙලා අයින්වෙලා මේ තිබෙන්නාවූ හේතු ඵල ධර්මයන්ගෙන් සම්පූර්ණයෙන්ම අයින් වී ඉවත් වී නිර්වාණ ධාතුවෙන් සැනසෙන්ට ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

තවත් මේ කියපු ධර්ම සමුදායට අතිරේකයක් වශයෙන් අපි ප්‍රයෝගිකව සිද්ධ කරන දෙයක් මම මේ පින්වතුන්ට කන වැකෙන්න අරින්නේ. දැන් මේ අභිධර්ම කථාව, මේ සාකච්ඡාව සුතමය ඥානයක් හැටියටයි හැදෙන්නේ. බොහෝ වෙලාවට චින්තාමය ඥානය හැදෙනවා භාවනාමය ඥානය හැදෙනවා, හැබැයි ටික වෙලාවයි. අපි පැයක් පැය එකහමාරක් වගේ වෙලාවක් කථා කරලා ගියහම අපේ මේ සැදැහැබර සිත අවධිකරගෙන කන් යොමාගෙන හිත් යොමාගෙන නුවණ යොදාගෙන ඉන්නා වූ පින්වතුන්ට ඒ වචන අනුසාරයෙන්

චින්තාමය ඥානය ගොඩක් හැදෙනවා. සුතමය ඥානයත් හැදෙනවා. සමහර වෙලාවට මේක කෙනෙකුට මතුකරගන්න පරතෝඝෝෂය එනම් අනුන්ගේ උදව්ව උපකාරය අවශ්‍යයයි. හැබැයි සමහර කෙනෙකුට හැරමිට්ට නැතිවෙලාවට යා ගන්න බෑ, ඇද වැටෙනවා වගේ දේශකයන් වහන්සේ හරි කියලා දෙන එක්කෙනා හරි ළඟ නැතිකල මේක තමන්ට ස්වාදීනව හිතින් මනසිකාරය පවත්වන්න අමරුවෙනවා. හැබැයි අපි මේ අනන්තර ප්‍රත්‍යය, මේ වැඩේ සිද්ධ වෙන එක ඇත්තටම මෙහෙම එකක් මෙහෙම සිද්ධ වෙනවා නේද කියලා ඇසූ බණට අනුව ඇසූ ධර්මයට අනුව දැනගත්ත විස්තර කථනයට අනුව අපේ මේ එදිනෙදා ක්‍රියාවකට ගොනු කරලා සම්බන්ධ කරලා දැන ගැනීමෙන්, මෙනෙහි කිරීමෙන්, තමන්ට චින්තාමය ඥානයයි භාවනාමය ප්‍රඥාවයි දෙකම ගොඩනගා ගන්න පුළුවන්.

වන්දනා කරනකොට ක්‍රම දෙකක් තිබෙනවා. එක වන්දනා ක්‍රමයක් තමයි අර්ථය සලකා වැඳීම, හෙමිහිට. අනිත් ක්‍රමය තමයි වැඳීම ලබා ගන්නාවූ බුදුරජාණන්වහන්සේ ගැන, වැඳීම ලබන ධර්මය ගැන, වැඳීම ලබන සංඝ රත්නය ගැන ආරම්මණික වශයෙන් හිත හරවා ගැනීම. ඔය දෙකම සමහරවිට කෙනෙකුට කරන්න බැරිනම්, අර්ථය තේරුම් ගන්න පාලි දැනගන්න ඕන. සිංහල දැනගන්න ඕන, ඉංග්‍රීසි දැනගන්න ඕන. ඒකත් අමාරුනම් සරලව කරන්න පුළුවන් මෙහෙම. 'මම මේ වදිනවා කියන වැඩේ කරන්නේ මෙන්න මේ උතුම් කෙනාටයි, මේ උතුම් ධර්මයටයි කියලා ඒ ලබන වස්තුව, පිළිමයක් හරි ගහක් හරි පොතක් හරි ධර්මයක් හරි අහස හරි වලාකුළ වගේ' කියලා හරි හිතා ගන්න පුළුවන්. සමහරුන්ට මේකත් අමාරුයි. එහෙනම් තිබෙන්නේ ගාථාව කියනකොට තමන්ගේ තොල්පොටවල් සෙලවෙන ආකාරයවත් හිත හිතා ඒක නුවණින් දකින්න පුළුවන්.

එහෙම නැත්නම් තවත් එකක් තිබෙනවා. ඒ තමයි වන්දනා කරන ශබ්දයට හිත තියා ගන්නවා. ඔය අවස්ථාවේදී තමන් විසින් හෙමිහිට හරි හයියෙන් හරි කියන්නාවූ වන්දනා ගාථා හඬට කන තබා ගැනීම තුල කුසල් ජවන් පහළ වෙනවා. ලෝභය ද්වේශය නෑ. තමන්ගේ කටේ තොල් පොටවල් සෙලවෙන ආකාරය මතුවෙනවා නම් ඒකට අනුව සිත් පහළ වෙනවා.

එහෙම නැත්නම් සජ්ඣායනා කරන ගාථා වල අර්ථය හිතනවා නම් ඒ අර්ථය මෙනෙහි කරන්නාවූ කුසල ජවන් සිත් පහළ වෙනවා. ගුණ දරන්නාවූ

ප්‍රතිග්‍රාහකයන් වහන්සේලා හෙවත් ඒ පූජණීය බුදුරජාණන්වහන්සේ ධර්මරත්නය සංඝරත්නය අරමුණු කරන්නේ නම් ආරම්මණික වශයෙන් කුසල් සිත් පහළ වෙනවා. අතිරේකයක් හරියට දැන් අපි වඳින වෙලාවේදී 'දැන් මේ වෙලාවේදී මට චිත්ත වීථි බොහෝ වශයෙන් පහළ වෙනවා, මේ උතුම් ත්‍රිවිද රත්නය අරමුණු කරගෙන. මේ වෙලාවේදී බුදුරජාණන්වහන්සේ ඒ දේශනා කරලා තිබෙන, බුදුරජාණන්වහන්සේ දැක බලාගෙන තිබෙන, සර්වඥතාඥානයෙන් දැකපු දෙයක් මේ හිත ඇතුලේ සිදු වෙනවා නේද. ඒ තමයි මේ වෙලාවේ අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ලබනවා හිත් ටිකක්, මේ වෙලාවේ අනන්තර ප්‍රත්‍යය ගුණය තිබෙන්නා වූ හිත් පහළ වෙනවා, අනන්තර ප්‍රත්‍යය ලබන්නා වූ ප්‍රත්‍යය උප්පන්න වූ සිතුත් පහළ වෙනවා' කියලා මනසිකාරයක් ඒකට ඇඳා ගන්න පුළුවන්කමක් තිබුනොත් කෙනෙකුට එවිට ඉතාම ඉහළ කුසල් සිත් පහළ වෙනවා. මේ කියපු කථාව ප්‍රායෝගිකව අපිට යොදාගන්න පුළුවන් අවස්ථාවක් තමයි මේ. මේකත් මට මේ වෙලාවේදී දේශනා කරපු ධර්ම කාණ්ඩයට අතිරේක වශයෙන් එක්කාසු කරන්න හිතුනා. සැම දෙනාටම සැප වේවා! තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක් </u>- ස්වාමීන්වහන්ස මේ පාලි කොටසින් විශේෂයෙන්ම කියවෙන්නේ අනුලෝම සිත ගෝත්‍රභූ සිතටත් - අනුලෝම සිත වෝදාන සිතටත් - ගෝත්‍රභූ සිත මාර්ග සිතටත් - වෝදාන සිත මාර්ග සිතටත් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එකයි. නමුත් අපි තේරුම් ගත්තා ස්වාමීන්වහන්ස අපිට විස්තර කරපු දේ අනුව ගෝත්‍රභූ සිත මහග්ගත සිත් වලට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක. මෙතනදී ඒක නොකියන්න විශේෂ හේතුවක් තිබෙනවද ස්වාමීන්වහන්ස? මාර්ග සිත්වලට පමණක් ගෝත්‍රභූ සිත ප්‍රත්‍යය වෙන බවක් සඳහන් වෙන එකේ විශේෂයක් තිබෙනවද? මහග්ගත සිත්ගැන සඳහන් නොකළේ ඒක කුසල ධර්මයකට නිරන්තරයෙන් අයිති වෙන හින්දද කියන එක පොඩ්ඩක් පැහැදිලි කරන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඒ කාරණය, මහග්ගත සිතට ගෝත්‍රභූ භාවයෙන් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඊළඟට ආර්ය භාවයට පත්වෙන අවස්ථාවේ දී ගෝත්‍රභූ සිත මාර්ග සිතට ප්‍රත්‍යය වෙනවා. මෙතැන මහග්ගත කියන වචනය පාවිච්චි නොකලාට අර්පණා ධ්‍යාන සිත් ගැන කියන කොට ඒ කිච්චේ ධ්‍යාන චිත්ත වීථියක ධ්‍යාන සිත් වලට කලින් පහළ වෙන්නාවූ ගෝත්‍රභූ සිත මහග්ගත

සිත්වලට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක කිව්වා ලෞකික වශයෙන්. හැබැයි ආර්යන් වහන්සේලාගේ සිත් ගැන කියන තැනකුත් ඉස්සරහදි එනවා. ඒක නිසා මේකට සම්බන්ධ කරගන්නේ නෑ. ගෝත්‍රභූ සිත්ගැන කියවෙන්නේ තැන් දෙහෙක. ධ්‍යානයකට කලියෙන් සහ පළවෙනි මාර්ග සිතේදී මාර්ග සිතට කලින්. ඔය ස්ථාන දෙකේ තමයි ගෝත්‍රභූ සිත්ගැන කියවෙන්නේ. ධ්‍යාන සිත්ගැන කිව්වට පස්සේ රූපාවචර අරූපාවචර හැම එකේම. මම ධ්‍යාන සිත්ගැන කියපු නිසා මහග්ගත කියන වචනය පාවිච්චි කළේ නෑ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස **පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං අනන්තරපච්චයෙන පච්චයො** කියන ඒ වීථියට ඒ සියල්ල අයිති වෙනවා කියලා තේරුණා. ගෝත්‍රභූ සිත ධ්‍යාන සිත් වලට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන එක අනු විසර්ජනාවට සම්බන්ධ වෙනවා වගේ තේරුණා. ස්වාමීන්වහන්ස මට දැන ගන්න කැමතියි ගෝත්‍රභූ හිත වොදාන හිත හැටියට ගන්න ඒකෙ වෙනසක් තිබෙනවද නැත්නම් ඒ හිතම කෘත්‍ය දෙකක් නිසා නම් දෙකකින් එනවාද? ඒවාගේම පරිකර්ම උපචාර අනුලෝම කියන තැන්වල එකම හිතද? ඒවායේ තත්වයන් වෙනස් වෙනවද නැත්නම් එකම හිත කෘත්‍ය හතරක් කරනවා කියන එකද කියලා පැහැදිලි කරගන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ලෝකෝත්තර මාර්ග සිත් පහළ වීමේදී ඉස්සරවෙලාම සිද්ධ වෙනතැන ගෝත්‍රභූ කියලා කියන්නේ පහත් වූ තත්වයක ඉඳලා ඉහළට ඔසවා තබන්නාවූ හිත යන අර්ථයෙන් ගෝත්‍රභූ නම් වෙනවා. පෘතක්ජන භාවයේ ඉඳලා උඩට ඔසවා තබන්නා වූ අර්ථයෙන් ගෝත්‍රභූ වෙනවා. ඉස්සෙල්ලාම ඒ ගෝත්‍රභූ සිතින් සලකුණු කරන්නාවූ දෙයක් තිබෙනවා. ඒ තමයි නිර්වාණය සලකුණු කරනවා. නමුත් කෙලෙස් නසන්නේ නෑ. ඉස්සෙල්ලාම ඒ වැඩේ කරන නිසා මාර්ග සිත් වලට කලින් නිවන සලකුණු කරන්නා වූ සිත යන අර්ථයෙන් පහත් තැනක ඉඳලා ඉහළට ඔසවා තබන අර්ථයෙන් ගෝත්‍රභූ වෙනවා. හැබැයි දෙවෙනි මාර්ග සිතේදී තුන්වෙනි මාර්ග සිතේදී සහ හතරවෙනි මාර්ග සිතේදී කලින් වගේ පෘතක්ජන භාවයෙන් ගොඩකිරීමක් නෑ. පෘතක්ජන භාවයෙන් ගොඩකරන්න ඔසවා තබන්න මොකක්වත් නෑ. සෝවාන් මාර්ගයෙන් පැහැදිලි කළා වූ පෙන්නා දෙන්නා වූ දේම තමයි සකෘදාගාමී මාර්ග සිතට කලින් සිද්ධ

වෙන සිතින් සලකුණු කරන්නේ. ඒක නිසා එතනදී දැකීම පිරිසිඳු වෙනවා. වෝදාන කියන එකේ තේරුම පිරිසිඳු කියන එකයි. පිරිසිඳුව පෙන්නනවා, පිරිසිඳුව සලකුණු කරනවා. ඒක නිසා ඉස්සරවෙලා දැකපු දේ තව ඩිංගක් පැහැදිලිව පිරිසිඳුව සලකුණු කළා. අනාගාමී වෙනකොට ඊට කලින් දැකපු දේකට වඩා තව ටිකක් වැඩියෙන් පැහැදිලිව පිරිසිඳු කළා කියන අර්ථයයි. එතකොට රහත් වෙනකොට සම්පූර්ණ උනා කියන අර්ථයෙන්. ආන්න ඒක හින්ද අපි හිතමු, අපි එක පාරක් ඇන්ද ඉරක් උඩින් තව පාරක් ඇන්දහම highlight වෙනවා, තව හොඳට පේනවා. තවත් පාරක් ඒක උඩින් ඇන්දට පස්සේ තවත් ටිකක් හොඳට පේනවා. ඊට පස්සේ හතරවෙනි වතාවටත් ඇන්දට පස්සේ තව හොඳටම සලකුණු වෙනවා. ආන්න ඒක නිසා තමයි සකෘදාගාමී අනාගාමී අරහත් කියන තැනට **වෝදාන** සිත කියලා පාවිච්චි කරන්නේ. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස එතකොට සෝවාන් හරි සකෘදාගාමී හරි අනාගාමී වහන්සේ නමක් නැවතත් ධ්‍යාන වඩනවා කියලා හිතුවොත් එතකොට ඒ ස්වාමීන්වහන්සේට එතකොට ඒ ධ්‍යාන චිත්ත වීථියේ ගෝත්‍රභූ සිත වෙනුවන් වෝදාන සිතද පහළ වෙන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - නෑ. එතනදී පහළ වෙන්නේ ගෝත්‍රභූ සිත. හේතුව එතැන ආර්ය සිත නොවෙයි කියන්නේ. දැන් එතන ධ්‍යානයකට ගියාට ඒ ධ්‍යානයෙන් කරන්නේ නිවන් දැකීම නොවෙයි. ධ්‍යානයෙන් කරන්නේ ධ්‍යාන ආරම්මණයට ගොඩවීමයි. නිවන් අරමුණු කිරීමේ අර්ථයෙන් තමයි ඒ මාර්ග චිත්ත වීථිවල ගෝත්‍රභූ සහ වෝදාන කථාව. ධ්‍යාන අවස්ථාවේදී සිද්ධ වෙන්නේ කාමාවචර සිතකින් බිඳිලා ගිහිල්ලා රූපාවචර ආරම්මණය හසුකරගන්න තැනින් ඒ කාමාවචර භාවයෙන් අනිත් පැත්තට යන හින්ද තමයි ඒකට ගෝත්‍ර භූ කියලා කියන්නේ. තෙරුවන් සරණයි!

බොහොම පින් ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස එතකොට පහළ ඉඳලා උඩට යනවා කියනකොට ලෞකික භාවයෙන් ලෝකෝත්තර භාවයට සම්බන්ධ වෙනවා කියන එකක්ද මේ කියන්නේ?

<u>පිළිතුර</u> - ඔව්. මේකේ තිබෙන්නේ අපේ සිත්වල තත්ව වශයෙනුත් ආරම්මණ වශයෙනුත් අවස්ථා දෙහෙක තිබෙන්නේ. අපි හිතමු තත්ව වශයෙන් ගත්තොත් එහෙම අපි තවම පෘතක්ජන තත්වයේ ඉන්නවා, හෝඩුවාවකින්වත් නිවන ස්පර්ශ කරලා නෑ කියලා. එතකොට අපි තවම පෘතක්ජන භාවයෙන් නිවන් නොදැක නිර්වාණ ධර්මය හසුකරගන්නේ නැතිව අපි ඉන්නවා. එතකොට අපිට හැමවෙලාවේම පහළ වෙන්නේ මේ පහත් තත්වයකට අදාළ බහුලවශයෙන් පුරුදුකරපු සිතුවිලි. මේ සිතුවිලි රාමුවේ අපි සීමා වෙලා තවම ඉහළ තැනක ස්පර්ශයක් නැති නිසා ඕනෑම තැනකට ඇදිලා යන්න පුළුවන් අපිට. අපාය ගාමී වීම වෙන වෙන තැන්වලට යෑම සිද්ධ වෙන්න පුළුවන්. ඒ පෘතක්ජන ගෝත්‍රයෙන්, ඒ තත්වයෙන් ඉහළ තත්වයකට යනවා කියන එකයි ඔය සෝවාන් වෙනවා කියන තැනේදී කියන්නේ. සෝවාන් මාර්ග චිත්ත වීථියේ ගෝත්‍රභූ කියන සිත නිවන සටහන් කරන හිත. එතනින් එහාට නිවන් අරමුණු කරගත්ත හිත. ඔය චිත්ත වීථියේ විස්තරය. 'භූ' කියන වචනයෙන් කියන්නේ ඉහළට යනවා, වැඩි කරනවා, දියුණු කරනවා කියන එකයි.

ඕක අපි ලෞකික වශයෙන් ගත්තයින් පස්සේ අපි සාමාන්‍යයෙන් කාමාවචර භූමියේ උප්පත්තියක් ලබන්ට සුදුසුකම් ලබාගෙන ඒ සිත්වල බහුලව හැසිරෙමින් එතනින් උඩට ගිහිල්ලා රූපාවචරයේ යම් යම් හිමිකම් කියන්න යන අවස්ථාවේදී ඒ චිත්ත වීථියෙත් තිබෙනවා ගෝත්‍රභූ සිත. ඒකෙන් කියන්නේ පෘතක්ජන භාවයෙන් මුදවනවා කියන එක නොවෙයි, කාමාවචර භූමියෙන් ඉහළ භූමියකට පත් කරනවා කියන එකයි. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මෙතෙන්දි මාර්ග චිත්ත වීථියක් හෝ ධ්‍යාන චිත්ත වීථියක් ගත්තොත් 'පරිකර්ම' 'උපචාර' කියන සිත් දෙකත් මීට කලින් පහළ වෙනවා. එහෙම සඳහන් නොකර 'අනුලෝම' 'ගෝත්‍රභූ' කියන දෙක සඳහන් කිරීම පිළිබඳ විශේෂ හේතුවක් දකින්න පුළුවන්ද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර </u>- ඔය ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ කියන සිත් දෙකේ තිබෙනවා වැඩිලා වැඩිලා ගිහිල්ලා උපරිමය. ඉස්සරහ එකට හරියට ගැලපිලා යන සිත් දෙකක් ඔය තිබෙන්නේ, ධ්‍යාන වශයෙන් හරි මාර්ග වශයෙන් හරි. අනිත් එක තමයි ‘පරිකර්ම’ ‘උපචාර’ කියන තැන් වලදී ලෝකෝත්තර වශයෙන් සහ ධ්‍යාන වශයෙන් ගත්තයින් පස්සේ ඕකේ තිබෙනවා මෙහෙම. ‘පරිකර්ම’ ‘උපචාර’ දෙකේම භාවනාව කෙරෙනවා තව. භාවනා ආරම්මණය අල්ලාගෙන ‘පරිකර්ම’ තව කරනවා. තව ටිකකින් ‘අනුලෝම’ සිත පහළ උනත් ‘පරිකර්ම’ අවස්ථාවේදී තවමත් භාවනාවක් කරනවා අරමුණ අල්ලාගෙන සමාධි ගත කිරීම් වශයෙන්. ඔය ධ්‍යානයට.

සෝවාන් වෙන අවස්ථාවේදී නම් සංස්කාර ආරම්මණය අල්ලගෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් තවත් වැඩ ටිකක් ඕකේ කරනවා. සංස්කාර අල්ලාගෙන ඉන්නවා එක තැනක. එක තැනක ධ්‍යාන ආරම්මණය අල්ලාගෙන ඉන්නවා. ඒකෙ වැඩ කරනවා. ඊළඟට ‘අනුලෝම’ සිත පහළ වෙන්නේ ඉස්සරහේදී පහළ වෙන්නා වූ හිතකට අනුකූල වෙන්නාවූ සිතක් වගේ, උපරිමයට ගිහිල්ලා. ඒක නිසා එහා පැත්තට බරවීමට හොඳටම ගැලපෙන අර්ථයෙන් තමයි ‘අනුලෝම’ සිත කියන්නේ. ඊට කලින් ‘පරිකර්ම’ ‘උපචාර’ දෙක හසු කර ගන්නේ නැත්තේ ‘අනුලෝම’ සිත හැදෙන්න ලං උනත් සංස්කාරත් එකක් හරි ධ්‍යාන ආරම්මණයත් එක්ක හරි අන්තිම පොඩ්ඩෙත් තව වැඩ කරන්න තියෙනවා වගේ නිසා, දැන් කෑම කාල කාල පිඟානයේ තිබෙන ටිකත් හුරාගෙන කනවා වගේ එකක් තිබෙන නිසයි ඒ හිත් ගන්නේ නැත්තේ. තෙරුවන් සරණයි!

තේරුම් ගත්තා ස්වාමීන්වහන්ස ටිකක් අර transition zone එක වගේ බොහොම කිට්ටුවට ඇවිල්ලා අර්පණා වලට හෝ මාර්ග සිත්වලට ක්‍රියාත්මක වෙන සිත්නිසා ඒ පිළිබඳව ඒ විදියට සඳහන් කරලා තිබෙනවා කියලා.

<u>ප්‍රශ්නයක්</u> - අවසරයි ස්වාමීන්වහන්ස සාමාන්‍යයෙන් තිබෙන්නේ ‘පරිකර්ම’ ‘උපචාර’ ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ ‘මාර්ග’. සාමාන්‍යයෙන් අපි අහලා තිබෙනවා මන්ද ප්‍රඥා වන්තයින්ට එල සිත් දෙකක් ඇතිවෙනවා පරිකර්ම අවස්ථාවක් එක්ක කියලා, ඊළඟට තීක්ෂණ ප්‍රඥාව තිබෙන එක්කෙනුකුට ‘උපචාර’ ‘අනුලෝම’

‘ගෝත්‍රභූ’ ‘මග’ ඊළඟට ‘ඵල’ හිත් තුනක් කියන එක. එතකොට මෙතැන ජවන් චිත්ත වීථියක් වගේ මනෝද්වාරාවජ්ජනයෙන් පස්සේ සිත් හත සම්පූර්ණ වෙනවා වගේ චිත්ත නියාමයකට යටත්වෙලාද මේ ‘පරිකර්ම’ ‘උපචාර’ ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ ‘මාර්ග’ ‘ඵල’ සිත් 2 ක් පහළ වෙන්නත් ‘උපචාර’ ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ ‘මාර්ග’ කියලා ‘ඵල’ සිත් 3 පහළ වෙන්නෙත්? ඒ වගේ අවස්ථාවක් පෙන්නලා තිබෙන නිසා මට අහන්න උවමනා උනේ. එතකොට ස්වාමීන්වහන්ස ‘පරිකර්ම’ ‘උපචාර’ ‘අනුලෝම’ ‘ගෝත්‍රභූ’ කියලා ඒ අවස්ථාවන් පෙන්නලා තිබෙන්නේ ජවන් සිත් හත සම්පූර්ණ වීමට වගේ මෙතනත් ඒ වගේ නියාමයක් තිබෙනවාද මනෝ ද්වාරවර්ජනයෙන් පස්සේ එහෙම සිත් 7 ක් පහළ වෙලා භවාංග ගත වෙන්න?

<u>පිළිතුර</u> - එහෙම කථාවක් තිබෙනවා සහ මීට ඉස්සෙල්ලත් චිත්ත වීථි කියන තැන්වල අපි කියලා දුන්නා. සමහර අයට ‘උපචාර’ පහළ වෙනවා ‘පරිකර්ම’ හැදෙන්නේ නෑ. සමහර අයට ‘පරිකර්මත්’ ‘උපචාරත්’ දෙකම හැදෙනවා. ඒකට හේතුව අපි බලමු. ඔය ඔතන උපරිමේ තිබෙන සිත් වලට යන්න කලින් අපි එදිනෙදා මොකක් වැඩක් කරන්න ගියහම, උදාහරණයකට දානයක් දෙනකොට වගේ වෙලාවක් බලමු. දැන් දානේ දෙන්නෙත් නිවන් දකින්න, සිල් රකින්නෙත් නිවන් දකින්න, භාවනා කරන්නෙත් නිවන් දකින්න, මල් පුදන්නෙත් නිවන් දකින්න. ඔය වැඩ කරනකොට මිනුස්සුන්ගේ තිබෙනවා යම් කිසි චරිත රටාවක්. ඒ චරිත රටාවට අනුකූලව තමයි හිත වැඩෙන්නෙත් හිතේ හැටියට තමයි වැඩේ කෙරෙන්නෙත්. දැකල ඇති සමහර අය, මම නම් දැකලා තිබෙනවා හරියට. සමහර අය අපි දානයකට ගියහම හරිම neat. හරි පිළිවෙලයි. ඒ කියන්නේ ආසනය පනවලා එයා දන්නවා හරියට ආසනය ඉස්සරහෙන් මොකක් හරි එකක් තියලා වතුර එක තියන්න, ඊට පස්සේ දානේ බෙදන කොට උනත් ඉස්සරවෙලා අත සෝදන්න ගෙනල්ලා, එයාගේ හැම වැඩ කටයුත්තකම තිබෙනවා පිළිවෙලක්. ඉස්සෙල්ලා පැන්, ඊට පස්සේ දානේ ඊට පස්සේ ව්‍යාංජන ඒවගේ පිළිවෙලක් තිබෙනවා. එතැන එයාගේ හිත වැඩ කරන්නේ මේකට පස්සේ මේක ඕන, මේකට පස්සේ මේක ඕන කියලා එයා හරියට නුවණ විහිදුවනවා. ක්‍රමානුකූලව ගානකට හොයල බලලා විමසලා කරන ගතියක් තිබෙනවා. ඔය එක චරිතයක්.

මේක මම කියන්නේ අපේ පින්වතුන්ට පිංකමකදී එහෙම මතක තියා ගන්න සහ දැනගන්න. කොහොමද 'පරිකර්ම' 'උපචාර' එන්න හේතු හැදෙන්නේ කියලා.

තව එකක් තිබෙනවා මෙහෙම. අපි හිතමු හාමුදුරුවරු පස් දෙනෙක් හිටියා කියලා. එයා එක හාමුදුරුවෝ කෙනෙකුට වතුර එකක් ගෙනැල්ලා දෙනවා. එයා ඊට පස්සේ ගිහිල්ලා තවත් කාත් එකක් හරි කථා කරලා ඊට පස්සේ ආයෙත් වතුර එකක් ගෙනල්ලා දෙනවා. ඊට පස්සේ පළවෙනි හාමුදුරුවන්ගේ එක අරගෙන ගිහිල්ලා ඊට පස්සේ තව එකක් අරගෙන ඇවිල්ලා තුන්වෙනි හාමුදුරුවන්ට දෙන්නේ නැතිව හතරවෙනි හාමුදුරුවන්ට දෙනවා. ඔහොම ඔහොම මිනුස්සුන්ගේ තිබෙනවා ක්‍රියාවකදී පිළිවෙලක් නැති, කැඩිච්ච ගතියක්. හරියට neatly කරන්නේ නෑ. අනිත් එක තමයි ඔය දානේ එහෙම බෙදන කොට මම දැකලා තිබෙන එකක් තමයි දැන් මිනුස්සුන්ගේ ගෙවල් වල හදල තිබෙනවානේ පිට්ටු ඉඳිආප්ප රොටි බත් වගේ දේවල්. මේක උදාහරණයක්. දැන් සමහර වෙලාවට බත් බෙදලා ඉවර වෙලා ඊට පස්සේ curry බෙදනවා, curry බෙදලා ඉවරවෙලා ඉඳිආප්ප බෙදනවා, හොදි බෙදනවා. හොදි බෙදලා ඉවරවෙලා පිට්ටු බෙදනවා. දැන් ඕක වෙන්න ඕන අනිත් පැත්තටනේ. පිට්ටු බෙදලා ඉවරවෙලානේ හොදි බෙදන්නේ. ඉඳිආප්ප බෙදලා ඉවරවෙලානේ පොල්සම්බල් අරව මේවා බෙදන්න ඕන. ඕක අනිත් පැත්තට කරනවා. ඔය දානය සම්බන්ධයෙන්.

බුද්ධපූජාවක් සම්බන්ධයෙන් බැලුවොත් එහෙම ඉස්සරවෙලා දානේ ටිකක් බෙදනවා. ඒක ගිහිල්ලා තියනවා. ඊට පස්සේ තව එකක් අමතක වෙනවා. ඊට පස්සේ හැන්දෙන් අරගෙන ගිහිල්ලා බෙදාපු පාත්තරේ උඩින් තියනවා. ඊට පස්සේ වතුර එක තියලා නෑ. ආයිත් වතුර එක අරගෙන යනවා. ඊට පස්සේ පපඩමක් තිබුනොත් ඒක අරගෙන යනවා. වරින් වර වරින් වර, කිසි ගැලපීමක් පිළිවෙලක් නෑ. ඔය වාගේ වැඩ කර කර අපි හිතමු භාවනා කරන්න යනවා කියලා. භාවනා කරන්න වාඩි උනාට පස්සේ පත්කඩේ දාගෙන නෑ. ඊට පස්සේ කොස්සක් තිබෙනවා නම් ඒක පිළිවෙලකට තියලා නෑ. හඳුන්කූරක් පත්තුකරලා නෑ. හඳුන්කූර ගහන්නේ හරහට. එතකොට අළුටික හරහට මේසෙට වැටෙනවා. ඔහොම ඒවා තිබෙනවා. භාවනා කරන්න ගියහම හිත සමාධි වෙන්නේ නෑ, එතනට එන කොට පිළිවෙලට කළයුතුව තිබු දේවල්

ටිකක් අතපසු වී තිබෙනවා. ඒක වරින් වර ඇවිල්ලා භාවනාව කඩා දානවා, 'මේක කරන්න බැරිඋනා මේක කරන්න බැරිඋනා' කියලා. පූර්ව කෘතිය කරන්න ගියාට පස්සේ පූර්ව කෘතිය කරන්නේ නෑ පිළිවෙලට. ටිකක් හිතනවා ටිකක් කැඩෙනවා ඔය විදියට කරනවා. ඔන්න ඕක නිසා එයාගේ නුවණ යම් කිසි දේකට යම් කිසි ක්‍රියාවකට තීක්ෂණව වැඩෙන්නේ නෑ. අනිත් එක තමයි බණ අහනව කියමු. බණ අහනකොට රේඩියෝ එක ටිකක් දානවා. බණ ටිකකුත් අහනවා. තව news එහෙකුත් බලනවා. නැවතත් බණ ටිකක් අහනවා. වටපිට බලනවා. ආයිත් බණ ටිකක් අහනවා. ආන්න ඒක නිසා ඒ ධර්ම දේශනාවෙන් හිතට හොඳට පේළියට pack වෙන්න අහන්න තිබෙන කරුණු ටික සමාධි ගතවෙලා ඇහෙන්නේ නෑ. ඔන්න ඔය කරුණු නිසා එයාගේ නුවණ සංස්කාර ස්පර්ශ කරකොට, සංස්කාර සම්මර්ශනය කරනකොට උනත් කැල්ල කැල්ල තමයි එන්නේ. ටිකක් මතුවෙනවා මෙනෙහි කරනවා. ඔන්න ඔය වගේ අයට 'පරිකර්ම' අවශ්‍යයි. 'පරිකර්ම' 'උපචාර' 'අනුලෝම' 'ගෝත්‍රභූ' යන සිද්ධිය වෙලා තමයි යන්නේ.

සමහර අය ඉන්නවා එහෙම නොවෙයි. ඔය වැඩ කරලා කරලා හොඳට පුරුදුයි. හොඳට neat එකට පිළිවෙලකට කරලා අතපසු වීම් වෙන්නේ නෑ. ආන්න එහෙම කරලා හොඳට පදන් වෙච්ච, පුළුවන් වෙච්ච හිත ගොනුකරගත්ත අයට භාවනා කරන්න ගියැන් පස්සේ මාර්ග චිත්තය ඇතිවෙන අවස්ථාවේ, ධ්‍යාන චිත්තය ඇතිවෙන අවස්ථාවේදී එයාට ආයේ අමුතුවෙන් 'පරිකර්ම' කරන්න වෙන්නේ නෑ. කෙලින්ම 'උපචාරයෙන්' ඉස්සරහට යනවා. ඔන්න ඕක තමයි වෙනස ඔය මන්ද බුද්ධිය සහ තීක්ෂණ බුද්ධිය ඇතිවෙන්න හේතු කාරණා ටික. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක්</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේගේ දේශනාව ශ්‍රවනය කරගෙන ඉන්නකොට මට අදහසක් ආවා ස්වාමීන්වහන්ස දැන් භාවනාමය පැත්තට නැතුව සාමාන්‍යයෙන් ලෞකිකත්වයේ ඉන්නකොට අපි හොඳ සිහියෙන් නුවණින් බලාගෙන ඉන්නවා. දැන් ඔබවහන්සේ කිව්වනේ එක සිතක් නැතිවෙලා ස්වභාවයෙන්ම අනිත් හිත ගැටී ගැටී යනවා කියලා. රස්නයක් වගේ ඒ සිතේ බලයෙන් ඊළඟ හිත ඇතිවෙනවා කියලා. එතකොට සමාන්‍ය ජීවිතයේ අපිට යම් කිසි අවස්ථාවක කුසල් අකුසල් දෙපැත්තට සිත යනකොට ඒ

ගැන බලල අපේ හිත හරවගන්න පුළුවන් නේද ස්වාමීන්වහන්ස කුසල් පැත්තට පමණක්?

<u>පිළිතුර</u> - පුළුවන්. අකුසල් සිතක් ආපු වෙලාවට ඒක කුසල් සිතක් බවට පරිවර්තනය කරගන්න පුළුවන්. ඒක ආරම්මණ වශයෙන් කරන්නත් පුළුවන්. එහෙම නැත්නම් අසම්මෝහ වශයෙන් කරන්නත් පුළුවන්. ආරම්මණ වශයෙන් කරන විදිය තමයි ලෝභ සිතක් ආසා සිතක් කාම සිතක් රාග සිතක් අවොත් ඒකෙ ආරම්මණය වෙනස් කරනවා ඒ ගැන පිළිකුල මෙනෙහි කිරීමෙන් අසුභය මෙනෙහි කිරීමෙන් ඒ වාගේම අප්‍රසන්න භාවය හිතට සංඥාවක් හැටියට ගැනීමෙන්. දැන් ඒක ආරම්මණයෙන් වෙනස් කළා. හැබැයි සමහර අයට ආරම්මණය දැම්මට වැඩ කරන්නේ නෑ. එහෙම අයට හොඳම දේ තමයි අකුසල් සිතක් ආවහම ඒ කියන්නේ මොකක් හරි ලෝභයක් හරි ද්වේශයක් හරි ඊර්ෂ්‍යාවක් හරි මොකක් හරි ආවහම ඒ හිත මෙහෙම හිතක් කියලා සිහිය යොදලා බලනවා. ඒකට කියනවා 'අසම්මෝහය' කියලා. හිතේ තිබෙන දේ තේරුම් ගන්නවා. මොකක්ද ආවේ, කුසලයද අකුසලයද ලෝභයද ඒ කුසලය කුසලය හැටියටත් අකුසලය අකුසලය හැටියටත් ලෝභය ලෝභය හැටියටත් මෝහය මෝහය හැටියටත් බලනවා. ආන්න එහෙම බලනකොට ඒ මෙනෙහි කිරීම තුලින් කුසල් සිත් පහළ වෙනවා. සතිපට්ඨාන සූත්‍රයේ ඔන්න ඔය වැඩේ තමයි කියලා තිබෙන්නේ. ඕක දෙකටම තිබෙනවා. 'ආරම්මණ' පිහිටුවීම් වශයෙනුත් තිබෙනවා. 'අසම්මෝහ' වශයෙනුත් තිබෙනවා. එහෙම පුළුවන්.

බොහොම පින් ස්වාමීන්වහන්ස!

හොඳයි එහෙනම් කාල වෙලාව සලකලා බලල සාකච්ඡාව මෙතැනින් සමාප්ත කරන්න අපිට අවස්ථාව තිබෙනවා. අද දවසෙත් අපි වෙනුවෙන් ඉතාමත්ම කරුණාවෙන් කාල වේලාව වෙහෙස නොබලා මේ ආකාරයෙන් skype තාක්ෂණය හරහා සම්බන්ධවෙලා අපිට නිතර අහන්න නොලැබෙන ධර්ම කරුණු මේ ආකාරයෙන් අපිට තේරුම් ගන්න පුළුවන් වෙන්න පුළුවන් තරම් සරල කරලා කියාදෙන ඔබ වහන්සේට අපි සවනට සිසිලස වෙනුවෙන් අපේ ප්‍රණාමය පුණ්‍යානුමෝදනාව පුදකර සිටිනවා ස්වාමීන්වහන්ස. එහෙමනම් ඔබ

වහන්සේට ඉතාමත් ගෞරවයෙන් අද දවසේ සාකච්ඡාව නිමා කිරීම සඳහා යොමුවෙනවා ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

හොඳයි, සැම දෙනාටම යහපතක් වේවා! රත්නත්‍රයේ සරණයි! අදත් අපි අපේ කාලය අරගෙන බුදුරජාණන්වහන්සේ දැකපු උන්වහන්සේගේ හිතින් ස්පර්ශ වෙච්ච තැන් වලට තමයි අපි මේ බොහෝම සියුම්ව යන්න ගියේ. මේකත් මතකයට ආව නිසා අවසාන වශයෙන් මේ පින්වතුන්ට කියන්නේ. සූත්‍ර දේශනාවක් තිබෙනවා මජ්ඣිම නිකායේ **චූළහත්ථිපදෝපම සූත්‍රය** කියලා. මම හරිම ආසා කරන සහ ධර්මච්ඡන්දය කුසලච්ඡන්දය පහළ කරන හරිම වටිනා සූත්‍රයක්. වන්දනා ගමනක් වගෙයි ඒ සූත්‍රය. ඒකට හේතුව බුදුරජාණන්වහන්සේ චූළහත්ථිපදෝපම සූත්‍රය විස්තර කරන තැන කියනවා පද හතරක්. තථාගත ඥාන පද හතරක්. ඒ තමයි ‘පළවෙනි ධ්‍යානය’ ‘දෙවෙනි ධ්‍යානය’ ‘තුන්වෙනි ධ්‍යානය’ සහ ‘හතරවෙනි ධ්‍යානය’.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා පළවෙනි ධ්‍යානය ඇති උනානම් එයාට හිතන්න කියලා මේ පළවෙනි ධ්‍යානය කියන්නේ තථාගතයන් වහන්සේ ගිහිල්ලා නැවතිලා හිටපු තැනක්, තථාගතයන් වහන්සේගේ ඥානය කියන පා සටහන් තබපු තැනක්, මේ ධ්‍යානය කියලා. ඒක නිසා යම් කිසි කෙනෙකුට ධ්‍යාන සිතක් පහළ උනේද ඒ තථාගතයන් වහන්සේ වැඩ හිටපු ස්ථානයක්, තථාගතයන් වහන්සේ නැවතී සිටපු ස්ථානයක්, තථාගතයන් වහන්සේගේ නුවණ කියන ඒ ඥාන පදය ගටපු තැනක් කියලා සතුටුවෙන්න. දෙවෙනි ධ්‍යානයට ගියහමත් එහෙමයි. තුන්වෙනි ධ්‍යානයට ගියහමත් එහෙමයි. හතරවෙනි ධ්‍යානයට ගියහමත් හිතන්න කියනවා මෙන්න මේ ස්ථානය තථාගතයන් වහන්සේ ගිහිල්ලා නැවතී ගිමන් හැරපු තැනක්, තථාගතයන් වහන්සේගේ ඥානපදය ස්පර්ශ කරපු තැනක් කියලා.

අපි යන්නේ බාහිර වශයෙන්නේ. දඹදිවට යනවා ජයශ්‍රී මහා බෝධීන්වහන්සේ ළඟට යනවා. උන්වහන්සේ වැඩ හිටියා කියලා අපි හිතනවා, මෙනෙහි කරනවා. ඒවා නරකයි නෙමෙයි. ඒවා කරන්න ඕන. චිත්තප්‍රසාදය හරියට වැඩෙනවා. දඹදිව යන්න ඕනෑ. ඒවාගේම බුදුන් උපන් තැන ජම්බුද්වීපයේ නේපාලයේ

ඒවාගේම ජයශ්‍රී මහා බෝධින්වහන්සේ ළඟට ඊළඟට බරණැස්නුවර ඉසිපතනාරාමයට කුසිනාරානුවර ඒ උතුම් වූ චෛත්‍යය රාජයාණන් වහන්සේ වැඩ ඉන්න තැනට නැති නම් ඒ පරිනිර්වාණ චෛත්‍යයට යන්න ඕනෑ. මේ පළවෙනි දෙවෙනි තුන්වෙනි හතරවෙනි ධ්‍යාන හතර උන්වහන්සේ පැහැදිලිව අලංකාරව ලස්සනට කියලා දේශනා කරලා තිබෙනවා. මෙන්න මේ ස්ථාන හතර අපි භාවනාවක් තුලින් ගිහිල්ලා වැඳ පුදා ගන්න ඕනෑ. පළවෙනි ධ්‍යානය දෙවෙනි ධ්‍යානය තුන්වෙනි ධ්‍යානය හතරවෙනි ධ්‍යානය තථාගතයන් වහන්සේගේ ඥාන පද සටහන් තැබූ තැන් කියලා. හැබැයි එච්චර යා ගන්න ගන්න බැරි උනත් අපි අද මේ කථා කරපු ටික අපිට පුළුවන් හිතන්න මේ විදියට. "ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මෙන්න මේ කියන්නාවූ ධර්ම කාරණා ළඟ, මේ චිත්ත වීථිවල වල, මේ ජවන් සිත්වල, මේ ස්ථාන වල තිබෙන අනන්තර ප්‍රත්‍යය බුදුරජාණන්වහන්සේ දැකපු දේවල්. බුදුරජාණන්වහන්සේගේ චිත්තය ගටපු තැන්. මේ තමයි බුදුරජාණන්වහන්සේ වැඩ හිටපු උන්වහන්සේ බලපු දේවල්. උන්වහන්සේගේ නුවණට හසුවෙච්ච දේවල්" කියලා අපිට චිත්ත ප්‍රසාදය පහළ කරගන්න පුළුවන්.

ඒක නිසා අද මේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා අපේ පින්වත් ජයන්ත මහත්මයා පින්වත් පිරිස එක්කාසුකරගෙන මේ සකස්කරගත්තාවූ ධර්ම මණ්ඩපය තුලින් අපිත් ඇත්ත වශයෙන්ම අවිහිංසකව වන්දනා ගමනක් ගියා වගෙයි. බුදුරජාණන්වහන්සේ තමන්වහන්සේගේ ස්වයම්භූ ඥානයෙන් උන්වහන්සේම දැක බලාගෙන උන්වහන්සේගේ පාරමී ධර්ම ශක්තියෙන්ම උන්වහන්සේ වැඩම කරපු ස්ථාන අපි මේ පොඩියට පොඩියට ගාට ගාට ගිහිල්ලා මෙන්න මෙතන මෙන්න මෙහෙමයි බුදුරජාණන්වහන්සේ දැක්කේ කියලා, අපිට වැඩි හයියක් නැති උනත් අපි මෙහෙම පොඩියට ගිහිල්ලා උන්වහන්සේගේ ධර්මය තිබෙන තැන් කියපු තැන් අපි මේ සාකච්ඡාව තුලින් සපර්ශ කළා. ඒ වාගේම ධර්ම ගමනක්, වන්දනා ගමනක්, බුදුන් වැඩිය තැනකට තමයි අපි මේ තුලින් ගමන් කලේ. ඒක නිසා මේ තුලින් අපේ පින්වත් සැම දෙනාට මහාණීය කුසල ධර්මයන් අත්පත් උනා. කුසල් වැඩුනා. මේ පුණ්‍යශක්තිය සැමදෙනාටම චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධය පිණිස වේවා! නිර්වාණ ධාතුව අවබෝධ වීම පිණිස වේවා! බුදුගුණ හිතීම පිණිස වේවා! දහම් ගුණ සඟ ගුණ මතුකර ගැනීම පිණිස වේවා! බය සැක නැතිකර ගැනීම පිණිස වේවා! ඒවාගේම අපාය දුකෙන් මිදීම පිණිස වේවා! තිරිසන් ලෝකයේ

දුකෙන් මිදීම පිණිස වේවා! සතර අපායෙන්ම මිදිලා ආර්යන් වහන්සේලා ගමන් කළ ඒ ගමන් මග ලබා ගැනීම පිණිස වේවා!

අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් නිදුක් නිරෝගී සැප ලැබේවා! සැම දෙනාටම කෙලවර ශාන්ත වූ නිර්වාණ ධාතුව සුවසේම සිද්ධ වේවා! කියලා මම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.